# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 53 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1973 දෙසැම්බර් මස 11 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1973 දෙසැම්බර් මස 21 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 53 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1973 දෙසැම්බර් මස 11 වන දින]

එල්. ඩී.—ඔ. 16/72

**කම්කරු විනිශ්චය අධිකාර වෙත ඉදිරිපත් කරනු ලැබූ ඇතැම් ඉල්ලීම් සම්බන්ධයෙන් විශේෂ විධිවිධාන සැලැස්වීම පිණිස ද කාර්මික ආරාවුල් පනත සංශෝධනය කිරීම පිණිස සහ ඒවාට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

**ලුහුඬු නාමය.**

**1.** මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 53 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**කම්කරු විනිශ්චය අධිකාර වෙත ඉදිරිපත් කරනු ලැබූ ඇතැම් ඉල්ලීම් සම්බන්ධයෙන් විශේෂ විධිවිධාන.**

**2.** (1) ප්‍රධාන ප්‍රඥප්තියේ 31ආ (1) වන වගන්තියේ (අ) ඡේදය හෝ (ආ) ඡේදය හෝ යටතේ කම්කරු විනිශ්චය අධිකාර යක් වෙත අදාළ කාලය තුළ දී ඉදිරිපත් කරන ලද යම් ඉල්ලීමක්, අදාළ නියෝගය මගින් නියමිත මාස තුනේ කාලය තුළ ඉදිරිපත් නොකිරීමේ හේතුව නිසා සහ එම හේතුව නිසාම පමණක් ඒ කම්කරු විනිශ්චය අධිකාරයේ නියමයක් අනුව බාර ගනු නොලැබූ අවස්ථාවක, එම නියමය අවලංගුව හා බල රහිතව පැවැති ලෙස ද අවලංගු යයි හා බල රහිත යයි ද සැලකිය යුතු ය. තව ද එම ඉල්ලීම ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ අලුතෙන් බාරගෙන විභාග කොට තීරණය කිරීමට කම්කරු විනිශ්චය අධිකාරය වෙත මෙයින් බලය දී බලය පවරා නියම කරනු ලැබේ. තව ද එසේ කිරීමට එම විනිශ්චය අධිකාරයට අධිකරණ බලය ඇත්තේ ය.

(2) ප්‍රධාන ප්‍රඥප්තියේ 31ආ (1) වන වගන්තියේ (අ) ඡේදය හෝ (ආ) ඡේදය හෝ යටතේ කම්කරු විනිශ්චය අධිකාර යක් වෙත අදාළ කාලය තුළ දී ඉදිරිපත් කරන ලද යම් ඉල්ලීමක් අදාළ නියෝගය මගින් නියමිත මාස තුනේ කාලය තුළ ඉදිරිපත් නොකිරීමේ හේතුව නිසා සහ එම හේතුව නිසාම පමණක් ඒ කම්කරු විනිශ්චය අධිකාරයේ නියමයක් අනුව නිෂ්ප්‍රභ කරනු ලැබූ හෝ ඉවත ලනු ලැබූ හෝ අවස්ථාවක එම නියමය අවලංගුව සහ බල රහිතව පැවැති ලෙස ද අවලංගු යයි හා බල රහිත යයි ද සැලකිය යුතු ය. තව ද එම ඉල්ලීම ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ අලුතෙන් විභාග කොට තීරණය කිරීමට කම්කරු විනිශ්චය අධිකාරය වෙත මෙයින් බලය දී බලය පවරා නියම කරනු ලැබේ. තවද එසේ කිරීමට එම විනිශ්චය අධිකාරයට අධිකරණ බලය ඇත්තේ ය.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 31ආ වන වගන්තිය සංශෝධනය කිරීම.**

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 31ආ වන වගන්තියේ (6) වන උප වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් එම ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

2—ඒ 02225—10,882 (73/11)

"(7) යම් කම්කරුවකු සම්බන්ධයෙන් මේ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය හෝ (ආ) ඡේදය හෝ යටතේ කම්කරු විනිශ්චය අධිකාරයක් වෙත කරනු ලබන සෑම ඉල්ලීමක් ම ඒ කම්කරුවාගේ සේවය අවසන් කළ දින සිට මාස හයක කාලයක් ඇතුළත කරනු ලැබිය යුතු ය.".

මේ පනතේ විධිවිධාන ප්‍රධාන ප්‍රඥප්තියේ හෝ වෙන යම් ලිඛිත නීතියක හෝ විධිවිධාන අභිභවා බල පැවැත්විය යුතු බව.

4. මේ පනතේ විධිවිධාන ප්‍රධාන ප්‍රඥප්තියේ හෝ අන් කිසි ලිඛිත නීතියක හෝ විධිවිධානවල බල හීනකිරීම් වශයෙන් නොව ඒවාට අමතරව විය යුතු අතර, ඒ අනුව එම විධිවිධාන ප්‍රධාන ප්‍රඥප්තිය සමග එකක් සේ කියවා තේරුම් ගත යුතු ය:

එසේ වුව ද, මේ පනතේ විධිවිධාන සහ ප්‍රධාන ප්‍රඥප්තියේ හෝ අන් කිසි ලිඛිත නීතියක හෝ විධිවිධාන හා අතර යම් ගැටුමක් හෝ නොගැළපීමක් ඇති වන අවස්ථාවක, ඒ ගැටුමට හෝ නොගැළපීමට හෝ අදාළ වන තාක් දුරට මේ පනතේ විධිවිධාන ප්‍රධාන ප්‍රඥප්තියේ හෝ ඒ අන් ලිඛිත නීතියේ හෝ විධිවිධාන අභිභවා බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

5. මේ පනතෙහි—

"අදාළ කාලය" යන්නෙන් 1958 කාර්මික ආරාවුල් නියෝග ක්‍රියාත්මක වූ දිනෙන් ආරම්භව මේ පනත ක්‍රියාත්මක වන දිනෙන් අවසාන වන කාලය අදහස් වේ;

"අදාළ නියෝගය" යන්නෙන් 1958 කාර්මික ආරාවුල් නියෝග වල 16 වන නියෝගය අදහස් වේ; තව ද

"ප්‍රධාන ප්‍රඥප්තිය" යන්නෙන්, පසුව සංශෝධනය කර ඇති පරිදි (131 වන අධිකාරය වූ) කාර්මික ආරාවුල් පනත අදහස් වේ.